(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 2(7)]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2008 දෙසැම්බර් මස 22 වැනි සඳුදා**

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා.45/'08

ගරු රනිල් වික්‍රමසිංහ මහතා,
ගරු තිස්ස අත්තනායක මහතා,
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,
ගරු රේණුකා හේරත් මහත්මිය,
ගරු ජෝන් අමරතුංග මහතා,
ගරු රවී කරුණානායක මහතා,
ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,
ගරු දයාසිරි ජයසේකර මහතා,— රජය කෙරෙහි විශ්වාස භංගත්වය,**—** රජයේ සියලු මූල්‍ය රෙගුලාසිවලට පටහැනිව සහ ශ්‍රී ලංකාවට මුළුමණින්ම අවාසිදායක වන්නා වූ ආකාරයට, රජය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් විදේශීය මෙන් ම දේශීය බැංකු ගණනාවක් සමඟ ඉතා සැකකටයුතු ආකාරයේ හෙජින් (ඉදිරි මිල සුරකුම්) ගිවිසුමට එළඹ ඇති හෙයින් ද;

එකී හෙජින් ගිවිසුමට එළඹ ඇත්තේ මහ බැංකුවේ අධිපති විසින් දෙන ලද නිශ්චිත උපදෙස් හා ඉන් අනතුරුව කරන ලද කරුණු ඉදිරිපත් කිරීම මත පදනම්ව වන හෙයින් ද;

එම ගිවිසුම අත්සන් කිරීමට පෙර සිදු වූ සිද්ධිදාමය පිළිබඳව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, අපනයන සංවර්ධන සහ ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු අමාත්‍යවරයා සහ මහ බැංකුව විසින් පරස්පර විරෝධී ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද;

ඇ. ඩො. බිලියන 25 ක් වන සුවිශාල විදේශ ණයක් එම බැංකුවලට ගෙවීමට ශ්‍රී ලංකාවට සිදු වී ඇති හෙයින් ද;

ලෝක වෙළඳපොළෙහි ශීඝ්‍රයෙන් පහත බසිමින් පවතින ඛනිජතෙල් මිල ගණන්වල වාසිය භුක්තිවිඳීමේ අවස්ථාව රටට අහිමි කරනු ලැබ ඇති හෙයින් ද;

රටේ මූල්‍ය කටයුතු විචක්ෂණශීලීව කළමනාකරණය කිරීමට රජයෙහි නොහැකියාව මෙම හෙජින් ගිවිසුමට එළඹී ආකාරයෙන් ප්‍රදර්ශනය වන හෙයින් ද මෙම සභාවට රජය කෙරෙහි විශ්වාසයක් නොමැති බව මෙයින් යෝජනා කර සිටිමු.

1—PL - 003106 — 800 (2008/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව